# ලුණුගල ප්‍රාදේශීය සභාව 2022.04.26 වන දින පැවති
# මාසික මහ සභා රැස්වීම් වාතර්ාව

2022 අප්‍රේල් මස මාසික මහ සභා රැස්වීම 2022.04.26 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

**මෙදින පැමිණීම,**

1. ගරු සභාපති — චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා
2. ගරු මන්ත්‍රී — පෙරියසාමි ලෝගනාදන් මැතිතුමා
3. ගරු මන්ත්‍රී — පලනියන්ඩි සුබ්‍රමනියම් මැතිතුමා
4. ගරු මන්ත්‍රී — ශ්‍රී හස්ත ලේකම්ලාගේ චන්දන සමන් කුමාර මැතිතුමා
5. ගරු මන්ත්‍රී — සුමනාවති මැතිනිය
6. ගරු මන්ත්‍රී — ජෙයකුමාර් පරමසිවම් මැතිතුමා
7. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ අසංක විජේබංඩාර මැතිතුමා
8. ගරු මන්ත්‍රී — පතිරණගේ කුමාරසිරි සමරවීර මැතිතුමා
9. ගරු මන්ත්‍රී — රත්නායක මුදියන්සේලාගේ සිරියාවති මැතිනිය
10. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ තිලකසිරි දිසානායක මැතිතුමා
11. ගරු මන්ත්‍රී — මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රී — රාජේන්ද්‍රන් මහාදේවි මැතිනිය
13. ගරු මන්ත්‍රී — වික්‍රමසිංහ ආරච්චි පතිරණලාගේ අනුර වික්‍රමතුංග මැතිතුමා
14. ගරු මන්ත්‍රී — රාජපක්ෂ වත්තේ විදානේලාගේ ඇඩ්වින් මැතිතුමා
15. ගරු මන්ත්‍රී — අබේකෝන් මුදියන්සේලාගේ ජයවීර අබේකෝන් මැතිතුමා

**න්‍යාය පත්‍රයට අනුව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.**

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ ඉල්ලීමට අනුව පාස්කු ප්‍රහාරයෙන් විපතට පත් වුවන් හා පසුගිය දිනෙක රඹුක්කන පොලිස් වෙඩි පහරින් මියගිය 42 හැවිරිදි කේ.ඩී.චමින්ද ලක්ෂාන් මහතා සිහි කරමින් විනාඩි 02ක නිශ්ශබ්දතාවයක් පැවැත්විය.

**01. පසුගිය සභා වාතර්ාව සභා සම්මත කර ගැනීම**

**01/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවෙහි 04 පිටුවෙහි මා විසින් ප්‍රකාශ කරනු ලැබූ මඩොල්සිම වැසිකිළිය අසල කසළ බැහැරලීම සම්බන්ධව කරුණු වාතර්ාවට ඇතුලත් වී නොමැති බැවින් එය සංශෝධනය විය යුතු බව පැවසීය.

**2022.03.22 වන දින පැවති මහ සභා රැස්වීම් වාතර්ාව ඉහත සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු බවට ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාතර්ාව ඒකමතිකව සම්මත විය.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන :- නැත.**

**03. සංදේශ/ පෙත්සම්/ පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමවීර මැතිතුමා විසින් ප්‍රදේශවාසින් විසින් ඉල්ලීම් කරන ලද පහත සඳහන් කරුණු සභාගත කරන ලදි.**

**03/1.** පාසල් මාවත ද අදාළ වන සේ පල්ලේපංගුව ගමට පිවිසීමට ඉදි කරනු ලැබූ පාලමෙහි තීන්ත ආලේප කිරිම.

**03/2.** තොරණක් ඉදි කිරිම සඳහා පාක්වත්ත මංසන්ධියේ අත්තිවාරම් කපා ඇති අනාරක්ෂිත වලවල් 02 වටා කඩිනමින් වැටක් සවි කර ආරක්ෂිත කිරිම.

**03/3.** ගරු මන්ත්‍රි පි.සුබ්‍රමනියම් මැතිතුමාගේ ප්‍රතිපාදන මත ලුණුගල මහ රෝහල සඳහා ජල පෙරන 02 ක් ලබා දුන් නමුත් මේ වනතුරු එය සවි කර නොමැත. එබැවින් කඩිනමින් ඒවා සවි කර දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලීම් කර ඇත.

**03/4.** 2022.03.28 වන දින රට පුරා පැවති විරෝධතා දිනය නිමිත්තෙන් ලුණුගල නගරයේද විරෝධතාවයක් පැවැත්විය. එහිදි බස් නැවතුම්පල අසල ටයර් පුළුස්සනු ලැබූ අතර දින කිහිපයක් ගත වන තුරු ඒවා මාගර්යෙන් ඉවත් කොට පිරිසිදු කර නොමැත. අනතුරුව ත්‍රි රෝද රථ හිමියන් කිහිපදෙනෙකු විසින් ජලය යොදා මාගර්ය පිරිසිදු කර තිබේ. ඔවුන් වෙත මාගේ ස්තුතිය පිරිනමමි.

**03/5.** මිට පෙර සභාවට යොමු කරනු ලැබූ ටයර් නැවත පුරවා භාවිතා කිරිමේ යෝජනාව සඳහා ගරු ජනාධිපතිතුමා විසින් සාධනීය පිළිතුරක් මා වෙත යොමු කර ඇති අතර එය රටේ අවශ්‍යතාවයක් ලෙස එතුමා විසින් පිළිගෙන තිබෙනවා. ඒ අනුව පළාත් 09 සඳහා කමර්ාන්ත ශාලා 09 ක් ස්ථාපිත කිරිමට එතුමා අදහස් කොට තිබෙන බව මා වෙත දැනුම් දී ඇති නමුත් අප ආයතනයට එම යෝජනාව ක්‍රියාත්මක කිරිමට නොහැකි වුවා. එලෙස ක්‍රියාත්මක කරන්නේ නම් වසරකට මිලියනයක් ඉතිරි කර ගත හැකි වනු ඇත.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙය හොඳ යෝජනාවක් වන අතර රජයේ චක්‍රලේඛයක් නිකුත් වන්නේ නම් එම යෝජනාව ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එසේම මේ පිළිබඳව කොමසාරිස්තුමා වෙතින් ලිඛිතව උපදෙස් ලබා ගන්නා මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**03/6.** ලුණුගල සුමුදුගම පෙර පාසලෙහි පවතින අනාරක්ෂිත ගස කඩිනමින් ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටිමි. එසේම ඒ අසල පිහිටි එයට සමාන්තර වෙනත් ගසක් කප්පාදු කොට ඇති අතර මේ ගස ඉවත් කොට නොමැත. එබැවින් කඩිනමින් එම ගස ඉවත් කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

**03/7.** ලුණුගල ප්‍රාදේශිය සභා භූමියේ ඉඩම කඩිනමින් නීත්‍යානුකූලව පවරා ගන්නා ලෙසත් එය තවදුරටත් ඩබ්.ඒ.පි.ජයතිලක නමින් ලියාපදිංචි වී තිබෙන බවත් අනාගතයේ ආයතනයේ උන්නතිය උදෙසා එම කායර්ය කඩිනමින් සිදු කරන ලෙසත් ඉල්ලා සිටිමි.

**03/8.** ලුණුගල ජල සාම්පල් පරික්ෂා කරනු ලබන ස්ථානයේ දිවා රාත්‍රි දෙකෙහිම දැල්වෙන විදුලි බුබුළු පවතින බැවින් දහවල් කාලයේ එම විදුලි බල්බ නිවා දැම්මට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි.

**04. කල් දී ඇති ප්‍රශ්න :-**

**<u>04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**04/1/1.** P.P.අරමුදලෙන් ඉල්ලුම් කළ ද්‍රව්‍යය, දැනට ලබාදී ඇති ද්‍රව්‍යය, ඉදිරියට ලැබිය යුතු ද්‍රව්‍යය, එම සම්පූර්ණ වටිනාකම, ලැබුන ලැබෙන භාණ්ඩ වල වගර්ය ලිඛිතව ලබාදෙන්න.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ඊට අදාළ පිළිතුරු ලිඛිතව ලබා දෙන ලදි.

**<u>04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**04/1/2.** මෙම අබර්දකාරි අවස්ථාවේ ලුණුගල ප්‍රාදේශිය සභාව පාලනය කළ වියදම් සහ ඉදිරියට පාලනය කරන සැලසුම් ඉදිරිපත් කරන්න ලිඛිතව. අපේ ජනතාව සහ රට වෙනුවෙන් කළ හැකි දේ.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ඒ සම්බන්ධව ඉදිරියේදි පිළිතුරු ලබා දෙමි.

**<u>04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**04/1/3.** 2022.04.01 සිට 2022.04.22 දක්වා ප්‍රාදේශිය සභා වාහන වල ඉන්ධන භාවිතය ඉන්ධන ඇණවුම් ප්‍රවාහනය එම ඉන්ධන භාවිතා කළ වාහන වල ධාවන සටහන් ඉතිරි ප්‍රමාණය 2022.04.22

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ඊට අදාළ පිළිතුරු ලිඛිතව ලබා දෙන ලදි.

**05. කල් දී ඇති යෝජනා :-**

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/1.** ලුණුගල බස් නැවතුම්පලේ ඉහල මහල අංක 05 කඩකාමරය 2022.04.07 දිනට ටෙන්ඩර් කැඳවූ මුත් කිසිවකු විසින් අයදුම්පත් ලබා නොගන්නා ලදී. එම නිසා ඉදිරි කටයුතු සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි. (ටෙන්ඩර් කළ අවම ලංසු මුදල රු.500000.00)

එම යෝජනාව ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එම කඩ කාමරය ටෙන්ඩර් කළ යුතු අතර දැනට ලබා ගෙන සිටින පුද්ගලයා වෙතම සාධාරණ කුලි පදනම මත ලබා දිම සුදුසුය.

ඒ අනුව එම කඩ කාමරය ටෙන්ඩර් කොට දැනට ලබා ගෙන සිටින පුද්ගලයා වෙතම සාධාරණ කුලි පදනම මත ලබා දිමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/2.** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය නිලධාරින්ට සහ විශ්‍රාමිකයන්ට රු.5000.00 මාසික දීමනාවක් ලබා දීමට තීරණය කර ඇති නමුත් ලුණුගල ප්‍රාදේශිය සභාවේ දෛනික වැටුප් ලබන සේවකයින්ගේ දීමනාව ප්‍රතිපූර්ණය නොවන බැවින් සහ ස්ථිර සේවකයින් සඳහා 2022 අයවැයෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණවත් නොවන බැවින්, අදාළ වැය ශිෂර් සඳහා ප්‍රමාණවත් මුදල් වෙන් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එය මනුෂිය කාරණයක් වන අතර ගෙවීම් කිරිම සිදු කළ යුතුය. සභාවේ ආදායම සම්බන්ධයෙන් ගැටළුවක් පවතිනවා. සභාවේ ආදායම ද වැඩි කළ යුතු අතර ඒ සඳහා නයි මිරිස් වගාව යොදා ගත හැකිය. එසේම අප ආයතනයේ සේවයේ නියුතු හසිත මහතා සමඟ තවත් සේවකයින් සිව් දෙනෙකු ඒ වෙනුවෙන් නිදහස් කොට දෙන්නේ නම් එම ව්‍යාපෘතිය සාර්ථකව සිදු කළ හැකි බව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ පිළිබදව අවශ්‍ය පියවර ගන්නා ලෙස සභා ලේකම්තුමිය වෙත උපදෙස් ලබා දෙන ලදි.

ඒ අනුව මාසිකව රු.5000.00 දීමනාව ලබා දිමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/3.** LDSP ව්‍යාපෘතිය යටතේ ලුණුගල නගරයේ මධ්‍යම වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් කොටස් මුදලක් ලබාදෙන ලෙස කොන්ත්‍රාක්කරු විසින් ඉල්ලීමක් කර ඇති බැවින්, රු.3005439.12 ක් මුදලක් අරසන් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් කොන්ක්‍රීට් වකර්ස් ආයතනය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

එහි අත්තිවාරම් පමණක් යොදා තිබෙන බැවින් ගෙවීම් කිරීමේදි සැලකිලිමත් වන ලෙස ඉල්ලමි.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

කාමරීක නිළධාරිතුමාගේ අධීක්ෂණය යටතේ ගෙවීම් කිරිමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සභා ලේකම්තුමිය වෙත උපදෙස් ලබා දෙන ලදි.

ඒ අනුව එම මුදල් කාමරීක නිළධාරිතුමාගේ අධීක්ෂණය යටතේ ගෙවීම් කිරිමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/4.** ප්‍රාදේශිය සභාව සතු වාහන රාජකාරියේ යෙදවීම සඳහා ඉන්ධන ලබාදීම වෙනුවෙන් රු.131247.00 ක මුදලක් ලුණුගල ඉන්ධන පිරවුම්හලේ ආර්.එම්.නිමල් සෙනවිරත්න මහතාට ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/5.** PF 7347 කැබ් රථයට ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රු.10384.00 ක මුදලක් මඩොල්සිම ඉන්ධන පිරවුම් හලේ ආර්.එම්.ඉන්ද්‍රානි මිය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/6.**පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ලුණුගල වාණිජ මධ්‍යස්ථානය හා සුපිරි වෙළඳ සංකීර්ණයේ සතොස ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ලබාදීමට අදාළව මාසික බදු කුලී මුදල තීරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

එය රජයේ තක්සේරු දෙපාතර්මේන්තුව මඟින් තක්සේරු කිරිම නිවැරදි නොවේ. එය සභාව මඟින් තීරණය කළ යුත්තකි. වගර් අඩියක අගය 160 ක් වන්නේ නම් වගර් අඩි 2500 ක් සඳහා එම අගය ගණනය කොට අය කිරිම සුදුසු වේ.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මේ පිළිබඳව මා විසින් උපදෙස් ලබා ගනු ලැබූ අතර එහිදි තීරණය වූයේ තක්සේරු දෙපාතර්මේන්තුව මඟින් තක්සේරු කළ යුතු බවයි. ඒ සම්බන්ධව සභාවට තීරණයක් ගත නොහැකි අතර මීට පෙරද වෙලඳසැල් 06 ක් තක්සේරු කරනු ලැබූ බවත් මම ගොඩනැගිල්ල ද එලෙස තක්සේරු කළ යුතු අතර එහිදි තීරණය කරනු ලබන මුදල සභා ගත කරන බවත් පැවසීය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

සතොස ආයතනය යනු මේ වන විට පාඩු ලබන ආයතනයකි. එසේම අප ආයතනය සතු ඉඩම හෝ නීත්‍යාකූලව පවරා ගෙන නොමැත. එය කඩිනමින් සිදු කළ යුත්තකි. මාගර්ය ඉදි කිරිමේදි වන්දි හානි වූ ඉඩම් සඳහා වන්දි ලබා දීමේදි අප ආයතනයට අදාල ඉඩම් කොටසේ වන්දි මුදල් ලැබුනේ ඩබ්.ඒ.පී.ජයතිලක මහතා වෙතය. එබැවින් කඩිනමින් එය නිවැරදි කළ යුතුය.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එම කායර් කඩිනමින් සිදු කිරිමට අපේක්ෂා කරමි. එසේම තැන්පතු මුදලක් ලබා නොගන්නා හෙයින් මාසික කුලි මුදල වැඩි අගයක් ගැනිම අප ආයතනයට වාසි සහගත තත්ත්වයකි.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා.**

ලුණුගල ප්‍රාදේශිය සභාවක් ලෙස පැවතීමට පෙර මෙය සුළු නගර සභාවකි.ඩබ්.ඒ.පී.ජයතිලක මහතා ද මෙම ආයතනයේ සභාපතිධුරයේ කටයුතු කොට තිබේ. එම කාලයේදී එතුමා විසින් මෙම ඉඩම පරිත්‍යාග

කලාද යන්න ගැටළුවකි.එතුමා විසින් ආයතන කිහිපයක් වෙතම තම ඉඩම් පරිත්‍යාග කොට තිබෙනවා. දැනට මෙම ඉඩමේ ඉදි කිරීම් සිදු කොට තිබෙන බැවින් ගැටළුවක් ඇති නොවනු ඇත.තක්සේරුවක් සිදු කිරීම සුදුසුය. අද වන විට අත්‍යාවශ්‍ය ආහාර මිළ ඉතා සීඝ්‍ර ලෙස ඉහල යමින් පවතිනවා. තවද මෑතකදී ඉන්දියාවේ යාචකයින් පිරිසක් හා චීනයේ කුඩා දරුවන් පිරිසක් අප රට වෙත මුල්‍ය ප්‍රදානයන් සිදු කර තිබෙනවා. සභාවක් වශයෙන් කොතරම් මුදල් ප්‍රමාණයක් වැය කරනවාද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එය සැබැවින්ම ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් ද වැය කරන්නේ යනුවෙන් සිතා බැලිය යුතුය.

මේ වන විට රජයක් පවතිනවාද, පාලකයින් කටයුතු කරන්නේ කෙසේද යන්න සිතා බැලිය යුතු කාලයක් බවට පත් වී තිබෙනවා. පාලකයින් හට ජනතාව වෙත වගකීමට නොහැකි තත්ත්වයක් මතුව තිබෙනවා. අප සියලු දෙනා යථාර්ථයට මුහුණ දිය යුතුය. එබැවින් ආයතනයක් වශයෙන් වියදම පාලනය කළ යුතුය. ඉදිරි මාසයේ සිට එක් එක් වාහනයක් වෙත ඉන්ධන නිකුත් කිරීම් කළ ප්‍රමාණයන් වෙන් වෙන්ව ලබා දීමට කටයුතු සිදු කරන ලෙස ඉල්ලමි. එලෙස වියදම අවම කර ගනිමින් රටට ආදශර්යක් දීමට අප ආයතනය කටයුතු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි

ඒ අනුව නව ගොඩනැගිල්ලට අදාළව තස්සේරු දෙපාතර්මේන්තුව මඟින් තක්සේරුවක් සිදු කිරීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/7.**ලුණුගල නව වෙළඳසංකීණර්යේ ඉහල මහලය ඉදිකර එම ගොඩනැගිල්ල මහජන බැංකුව සඳහා කුලී පදනම මත ලබාදීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව නව ගොඩනැගිල්ල මහජන බැංකුව සඳහා ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/8.**ලුණුගල ජනතාපුර බහුආථර්ක මධ්‍යස්ථානයේ කඩකාමර 04 හා නව වෙළඳ සංකීණර්යේ අංක 13, 14 කඩකාමර සිවි වතාවක් රු.750000.00 කට ටෙන්ඩර් කැඳවූ මුත් කිසිවකු විසින් ලබා නොගන්නා ලදී. ඊට අදාළ ඉදිරි කටයුතු කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

ලක්ෂ 5 ½ ක මුදලක් සුදුසු බවට තීරණය කල යුතුය.

ඒ අනුව ලක්ෂ 5 ½ ක මුදලකට ටෙන්ඩර් කිරීමට සිදු කිරීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/9.**ලුණුගල ප්‍රාදේශිය සභාවේ නාමපුවරු අලුතින් සකස් කර ප්‍රධාන මාගර්යේ සවිකිරීමට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

රු.50000.00 ට යටත්ව නාම පුවරුව සැකසීම සුදුසුය.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

ඒ සඳහා PPTE මුදල් යොදවිය හැකිය.

ඒ අනුව රු.50000.00 ක මුදලකට යටත්ව නාම පුවරුව සැකසීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/10.**බදුල්ල - බිබිල, ලුණුගල - පස්සර සහ ලුණුගල හරහා ධාවනය වන පළාත් සහ අන්තර පළාත් බස් රථ නියාමනය කිරීම සඳහා ඌව පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ නිලධාරින් ලුණුගල බස් නැවතුම්පල රාජකාරි කටයුතු සඳහා යෙදවීමට බලාපොරොත්තු වන බවත්, ඒ සඳහා ලුණුගල බස්නැවතුම්පලේ ඉහල මහලේ දැනට හිස්ව ඇති කඩකාමරය පෞද්ගලික බස්රථ නියාමන කායර්ාලයක් පවත්වාගෙන යාමට ලබා දෙන ලෙස ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සාමාන්‍යාධිකාරි විසින් ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සභාවට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

පුද්ගලික ආයතනයක් සමඟ එක්වී එම බස් රථය යොදවන බව පැවසීය. ප්‍රදේශයේ ජනතාවගේ ගමන් පහසුව උදෙසා ඒ වෙනුවෙන් අනුමැතිය ලබා දීම සුදුසුය.

ඒ අනුව ලුණුගල බස්නැවතුම්පලේ ඉහල මහලේ දැනට හිස්ව ඇති කඩකාමරය පෞද්ගලික බස්රථ නියාමන කායර්ාලයක් පවත්වාගෙන යාමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/11.**පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) 2021 යටතේ ඉදිකරන ලද වාණිජ මධ්‍යස්ථානය හා සුපිරි වෙළඳ සංකීර්ණය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කමර්ාන්තය අදාළ කොටස් මුදල වන රු.3670361.09 ක මුදල ලැබී ඇති බැවින්, කොන්ත්‍රාත්කරු වන අරසන් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් කොන්ක්‍රීට් වකර්ස් ආයතන වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත කොටස් මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/12.**ලුණුගල මහජන පුස්තකාලයේ 2022 මාතර්ු මාසය සඳහා ලබාගත් පුවත්පත් වෙනුවෙන් ර.9900.00 ක බිල්පත ලුණුගල මධුකා ට්‍රේඩ් සෙන්ටර් වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/13.**AAM 9725 ත්‍රිරෝද රථය සේවා කිරීම වෙනුවෙන් රු.11800.00 ක මුදලක් ලුණුගල සුසන්ත මෝටසර් ආයතනයේ අයිතිකරු වයි.කේ.සුසන්ත මහතා වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/14.**ලුණුගල IOC ඉන්ධන පිරවුම්හලෙහි ඉන්ධන දිගු කාලයක් නොමැතිවීම හේතුවෙන් මඩොල්සිම ඉන්ධන පිරවුම්හලෙන් ප්‍රාදේශිය සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගැනීමට රු.50000.00 ක ඇප තැන්පත් මුදලක් මඩොල්සිම ඉන්ධන පිරවුම්හලෙහි ආර්.එම්.ඉන්ද්‍රාණි මහත්මියට ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/15.** ඥාතින් කිසිවෙකු නොමැතිව අවතැන්ව සිටි ලුණුගල ප්‍රදේශයේ ජීවත් වූ මනී මහතාගේ අවමංගල්‍ය කටයුතු වලට අදාළව මිනි පෙට්ටිය ලබා ගැනිම වෙනුවෙන් රු.20000.00 ක මුදලකට යටත්ව ගෙවීම් කිරිමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/16.** UPPC 0370 කැබ් රථයේ පවතින දෝෂ සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ විසින් ලබාදී ඇති පරීක්ෂණ වාතර්ාව අනුව මිලගණන් කැඳවූ අතර, අදාළ අලුත්වැඩියාව සඳහා රු.98750.00 ක මුදල බදුල්ල ලක්ෂිත මෝටසර් ආයතනය වෙත ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
ඉහත මුදල් ගෙවීමට අදාළව අනුමැතිය ලබා දීමට සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා.</u>**

**05/2/1.** වතර්මාන ආථර්ික සහ සමාජීය අබර්ුද වලට ලුණුගල ප්‍රාදේශිය සභාව/සභික/සභිකයින් විදියට අපට කළ හැකි වහාම කළයුතු දේවල් සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>

ගරු මන්ත්‍රී.පී.කුමාරසිරි සමරවිර මැතිතුමා හොඳ මාතෘකාවක් ඉදිරිපත් කොට තිබෙනවා. මේ වන විට රටේ පවතින වතර්මාන තත්ත්වය ඉතා අසීරුය. ඒ කාලේ තුන්වේලක් කන්න බැරිවසිටි මිනිසුන් හට අද එක වේලක් හෝ කන්න බැරිව ඉන්නේ. එවැනි අවස්ථාවක ප්‍රාදේශිය සභාවක් වශයෙන් පසුගිය කාලයේදී ජනතාව වෙනුවෙන් කල සේවාවන් පිළිබඳව නැවත හැරි බලන්නට සිදුවනවා. වතර්මාන ගරු ජනාධිපතිතුමා මෙතරම් අසීරුතාවයට පත්ව තිබෙන්නේ ප්‍රාදේශිය සභා හේතුවෙන් බවයි මාගේ හැඟිම. එම ආයතනයන් අතිශය දූෂිත තත්ත්වයට පත්ව තිබෙනවා. එසේම ලුණුගල ප්‍රදේශයේ ජල ව්‍යාපෘතියක් සිදු කරනු ලැබුවා.

අද වනතුරු විගණනයක් නොමැත. වාතර්ාවක් ඉදිරිපත් කොට නැත. එසේම අප DCC අවස්ථාවේදී ද මේ පිළිබඳව විමසීමක් සිදු කරනු ලැබුවා. එසේම මාගර් සංවධර්න ව්‍යාපෘති සිදු කර ඇත්තේ ජනතාවට ගැලපෙන ස්ථාන වල නොවේ. පවතින රජය බලයට පත් වූ අවස්ථාවේ කාපට් කිලෝ මීටර් ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ සිදු කල ව්‍යාපෘති අතරින් තාර පාරවල්, කොන්ක්‍රීට් මාගර් මතින් කාපට් යොදනු ලැබුවා.

මෙවැනි කටයුතු සිදු කලේ රජය නොවේ. අප ආයතනයක් වශයෙන් මෙවැනි අවස්ථා වලදී සැලකිලිමත් විය යුතුයි. සංවර්ධන ව්‍යාපෘති බොහෝමයක් කිසිදු සැළකිල්ලකින් තොරවයි සිදු කරනු ලැබුවේ.දිගින් දිගටම මේ පිළිබඳ වාතර්ා ඉල්ලීම් සිදු කලද මේ වනතුරු ලබා දුන්නේ නැත.

එම අවසාන වශයෙන් ඉල්ලීම් කරන්නේ කෝටි 19 ක් වැය කරමින් සිදු කල ජල ව්‍යාපෘතියේ සියලු වාතර්ා ඊලග සභා වාරයට ලබා දෙන ලෙසයි. එසේ කටයුතු සිදු නොකරන්නේ නම් ඌව පළාත් ආණ්ඩුකාරතුමා මුණගැසීමට යාමට අපේක්ෂා කරමි.

අප ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන් ලෙස තේරි පත්වී වසර 04 කි. අද වනතුරු සංවධර්න වැඩකටයුතු පිළිබඳ සාකච්ඡා කිරිමට කොළඹ ප්‍රදේශයට කැඳවා නොමැත.

අප ගෙන්වන්නේ පක්ෂ සම්මේලන සදහා පමණයි. වතර්මාන රජය බලයට පත් කරවීම සඳහා අප වෙහෙස මහන්සි වී කටයුතු කරනු ලැබුවා. ගරු ජනාධිපතිතුමාට කිසිදු වංචාවක් හෝ දූෂණ චෝදනාවක් නැහැ. අදටත් එතුමාට ජනතාව ආදරෙයි. එතුමා වටේ සිටින පිරිස සිදු කල ක්‍රියාවන් හේතුවෙන් එතුමාට ජනාධිපති මන්දිරයෙන් පිටතට පැමිණිමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබෙනවා. මෙම ආයතනයේ අය කොළඹ යන බව පවසමින් ඉන්ධන ලබා ගනු ලබන අතර මා පසුගිය සතියේ කොළඹ ප්‍රදේශයේ සිටි අතර රාජ්‍ය ලාංඡනය සහිත කිසිදු වාහනයක් කොළඹ ප්‍රදේශයේ දක්නට ලැබුනේ නැත.මුදල් කමිටුවේ සිටින නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටින්නේ අනවශ්‍ය මුදල් වෙන් කිරිම් සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙසයි. මහජනතාවගේ වරිපනම්, ජල බදු සොරා කන්න අවස්ථාවක් ලබා නොදෙන්න. මීට පෙර සභා අනුමැතියකින් තොරව වියදම් දැරිමේ අවම සීමාව රු.5000.00 ලෙස පැවතිය ද එය රු.ලක්ෂය දක්වා ඉහල නැංවීමට සභාවේ සියලු දෙනා එකඟතාවය ලබා දුන්නා.එහි ප්‍රථිපල ඔබට මට අද දක්නට ලැබෙනවා. ණය හිමියන් ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතිනවා. සභා ලේකම්තුමිය මේ පිළිබඳව කඩිනමින් විමශර්නය කළ යුතුය. අපි සියලු දෙනා මෙයට වගකිව යුතුය. මේ පිළිබඳව අඩු තක්සේරුවෙන් නොසිතිය යුතුය.

ආණ්ඩු පක්ෂයේ නිසා සියලු දෙයට එකඟතාවය ලබා දෙන්න එපා. අදින් පටන් මෙම ආයතනයේ ඇති පක්ෂ වහල්භාවය පසෙකලා වියදම් වන සතයක් හෝ පිළිබඳව සොයා බැලිය යුතුය. එසේම මිට පෙර වෙලඳසැල් ටෙන්ඩර් කොට ස්ථාවර තැන්පත් කොට තිබූ මුදල් මිට පෙර සභාලේකම්තුමා විසින් නැවත තැන්පත් කිරිමේ පදනම මත ලක්ෂ 50 ක මුදලක් ලබා ගනු ලැබුවා. නමුත් අද වනතුරු එම මුදල් තැන්පත් කොට නැත. මේ පිළිබඳව මා විසින් ලංකා බැංකුවෙන් විමසීමක් සිදු කරනු ලැබුවා.

රටේ පවතින තත්ත්වයක් සමඟ මෙලෙස මුදල් ගිණුම් වලින් ලබා ගෙන වියදම් සිදු කරන ආකාරය පිළිබඳව සභා ලේකම්තුමිය දැඩි ලෙස සුපරික්ෂාකාරි විය යුතුයි.ආණ්ඩුවත් අස්ථාවර තත්ත්වයේ පවතින බැවින් සංවේදි මිනිසුන් ලෙස අපද දැඩි ලෙස අපහසුතාවයට පත්ව තිබෙන අවස්ථාවක්. ඉන්ධන වියදම් දැඩි ලෙස පාලනය කළ යුතුය. පාලර්මේන්තු මන්ත්‍රීවරුන් පමණක් නොවේ ප්‍රාදේශිය සභා නියෝජිතයින් ද විගණනය කළ යුතු බවට් මාගේ අදහස. ජනතාවගේ මුදල් විනිවිදභාවයකින් තොරව යෙදවිය යුතුය. එලෙස කටයුතු නොකිරිම නිසයි ආණ්ඩුවේ ඉහලම තලයේ සිටින ජනාධිපතිවරයා මේ වනවිට අපහසුතාවයට පත්ව තිබෙන්නේ.

<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.</u>

අද න්‍යාය පත්‍රයේ 5.2.1 අනුව එම යෝජනා ඉදිරිපත් කල කුමාරසිරි සමරවීර මැතිතුමා හට ස්තුතිවන්ත වෙමි. එසේම ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා හඩ අවදි කිරිම පිළිබඳව ස්තුතිවන්ත වෙමි. මන්ද මේ සම්බන්ධව 2019 අයවැය කතාවේදී මා විසින් අදහස් පළ කරනු ලැබුවා.

එහිදි මා විසින් ප්‍රකාශ කරනු ලැබුවේ එවකට සිටි ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බලයෙන් ඉවත් විමට හේතු වූයේ එතුමාගේ ක්‍රියාවන් නිසා නොව බිම් මට්ටමේ සිටි දේශපාලන නියෝජිතයින්ගේ ක්‍රියාවන් නිසා බවයි. එම අවස්ථාවේදි අප සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ සමච්චලයට මා ලක් වුවා. එසේම වතර්මාන තත්ත්වය සම්බන්ධව සියලු පාක්ෂික මන්ත්‍රීවරුන් වගකිව යුතුයි. ගරු සභාපතිතුමාට පමණක් වරද පැටවිය නොහැකිය.2019 වසරේ සිට මා ස්වාධින මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරනු ලැබුවා. නමුත් අද හඩනගන කිසිවෙකු එදා කතා කලේ නැත.මා හට කිසිදු පක්ෂයක් සහයෝගය ලබා දුන්නේ නැහැ. වතර්මානයේ සභාවට වැඩි ආදායමක් ලැබෙන්නේ මා නියෝජනය කරනු ලබන ග්‍රාම නිළධාරි කොට්ඨාශයෙනි. ජල ව්‍යාපෘතියේ රැකියා ලබා දීම සිදු වූයේ ද නගර කොට්ඨාශය තුලයි. නමුත් කිසිවෙකු ඒ සම්බන්ධව කතා කලේ නැහැ. මම ඉහල දේශපාලඥයින්ට කඩේ යන පුද්ගලයෙකු නොවේ. දේශපාලනය මාගේ වෘත්තිය නොවේ. මෙය මාගේ සමාජ සේවයකි.

තවද කසල වෙන් කරනු ලබන යන්ත්‍රය සහා භූමියේ රඳවා තිබෙනවා. නමුත් මම පැවසුවා එය කමර්ාන්ත කමිටුව සතු කිරිම තුලින් ඵලදායිතාවය ඉහල නංවාදිය හැකි බව. වතර්මාන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුන් නැව ගිලෙන බව දැනගෙන ස්වාධින වුවද මා මීට පෙරම ස්වාධින විය. එසේම කමිටු සඳහා පැමිණෙන ගරු මන්ත්‍රිවරුන්ට ලබා දෙන දීමනාව මෙන්ම මාසික දුරකතන දීමනාව ඉවත් කොට ජනතාවට ආදශර්යක් ලබා දිය යුතු බවයි මගේ හැඟිම.

එසේම කායර්ාලයේ ගමන් වියදම් ශීඝර්ය පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු අතර අතිකාල ගෙවීම් සිදු කිරිමද සීමා කළ යුතු බවයි මාගේ හැඟිම.

<u>**ගරු මන්ත්‍රි පී.ලෝගනාදන් මැතිතුමා.**</u>

ඉහත යෝජනාව වෙනුවෙන් හඬක් නැගු ගරු මන්ත්‍රි අනුර වික්‍රමතුංග මැතිතුමා අද විපක්ෂයේ කායර්ය ඉටු කිරිම වෙනුවෙන් මාගේ ස්තුතිය පිරිනමමි.අප රට මේ වන විට දැඩි අබර්ුධකාරි තත්ත්වයකට මුහුණ දෙමින් සිටිනවා. එසේම විදෙස් ශ්‍රමිකයින් ඩොලර් එවිම සිදුකරන්නේ නැහැ. ඔවුන් වංචනිකව මුදල් එවීම සිදු කරනු ලබයි. පසුගිය දිනෙක සමාජ මාධ්‍ය ඔස්සේ සිදු කළ ප්‍රකාශයක් වන්නේ අප රටට ඩොලර් එවීම සිදු කළ හැකි බවත් ඒ වෙනුවෙන් ලංකාවේ වෙනම රාජ්‍යයක් ඔවුන් වෙත ලබා දිය යුතු බවත්ය. එමෙන්ම ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාලන සමය තුල අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල අවම මට්ටමේ පැවති අතර ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ දරුවාහට සතියකට ලබා දෙනු ලබන කිරිපිටි පැකට්ටුවේ මිල රු.50000.00 ක් බවද සමාජ මාධ්‍ය දක්වා තිබුනා. සාමාන්‍ය ජනතාව හට එදා වේල හෝ සොයා ගැනීමට නොහැකි තත්ත්වයක් මේ වන විට රට තුල උද්ගතව තිබෙනවා.

අප එකාවන්ව කටයුතු කළ යුතුයි. සවර් පාක්ෂික ආණ්ඩුවක් තුලින් රට පාලනය කරන්නේ නම් ජාත්‍යන්තර සහයෝගය අවශ්‍ය වනු ඇත. පසුගිය දිනෙක තමිල්නාඩු මහඇමතිතුමා පවසා සිටියේ උතුරු ප්‍රදේශයේ ජනතාව වෙත අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට හැකි බවයි. ඒ යෝජනාව සඳහා මා එකඟ වන්නේ නැත. ආධාර ලබා දෙන්නේ නම් සමස්ථ ශ්‍රී ලංකාවටම ආධාර ලබා දිය යුතුය. අප රට ජාතිවාදයෙන් භේද කිරිමට අවස්ථාව ලබා නොදිය යුතුය. එසේම විදෙස් බලවේග වලට යටත් නොවිය යුතුය. ඉදිරියේදි අප රට දේශපාලනිකව ස්ථාවර කල යුතුය. බෞද්ධ රට ආරක්ෂා කළ යුතුය.

<u>**ගරු මන්ත්‍රි ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා**</u>

ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් හඬක් නැගු ගරු මන්ත්‍රි අනුර වික්‍රමතුංග මැතිතුමා විසින් අප ආයතනයේ සිදු වු යම් යම් අකටයුතුකම් පිළිබඳව හෙළිදරව් කිරිම පිළිබඳව මාගේ සතුට ප්‍රකාශ කරනු ලැබුවා. එතුමා නියෝජනය කරනු ලැබූ හැටනව ලක්ෂයක් ඡන්දය ලබා දුන් නායකයා මෙන්ම සියලුම පුරවැසියන් අද වන විට දැඩි අසිරුතාවයට පත්ව තිබෙනවා. එයට හේතුව වත්මන් ජනාධිපතිතුමාගේ අදූරදශර්ී පාලන ක්‍රමයයි.වසර 72 ක කාලයක් මෙරට දේශපාලඥයින් සිදු කල අකටයුතුකම් හමුවේ පිඩාවට පත් වු ජනතාව නිපර්ාක්ෂික පුද්ගලයෙකු රටේ නායකයා ලෙස පත් කිරිමට කටයුතු කලා.

එසේම එතුමාගේ තේමාව වුයේ එක් රටක් එක් නීතියක් ලෙසිනි. එතුමා රාජ්‍ය පාලනය ඇරඹීමට පෙර රුවන්වැලි සෑයට ගොස් ආශිවර්ාද ලබා ගෙන අනතුරුව ප්‍රකාශ කරනු ලැබුවේ මෙය සිංහල බෞද්ධ ජනවරමක් ලෙසිනි. එසේම මෙරට බෞද්ධ රාජ්‍යයක් බවට පත් කරන බවටත් ප්‍රකාශ කරනු ලැබුවා.

නමුත් එතුමා සිදු කල යෝජනා අද ක්‍රියාත්මක වන්නේ නැත.වතර්මානයේදී කාබනික කෘෂිකමර්ාන්තය තුලින් ඇතිකල අස්ථාවරත්වය මේවන විට රට පුරා ව්‍යාප්ත වි හමාරය. මේ වට ආරම්භ කොට තිබෙන ගෝල්ෆේස් පිටියේ අරගලයෙහි අරමුණ වන්නේ මේ රට ගොඩනැගිමට හිතකර දේශපාලන වටපිටාවක් නිමර්ාණය කිරිමයි.

<u>**ගරු මන්ත්‍රි පී.සුබ්‍රමනියම් මැතිතුමා**</u>

මිට පෙර මා විසින් ප්‍රකාශ කොට තිබෙනවා බලය ඇති විට මොළය නැති බවත්, මොලය ඇති විට බලය නැති බවත්ය. ඒ බව අද ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රිවරු තේරුම් ගත්තා. එදා මම කිව්වා වැරදි හදාගෙන ඉදිරියට යමු කියලා. නමුත් එදා ඒ බව පිළිගත්තේ නැහැ.1972-1977 කාලයේදී ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ සමයේදී මෙරට ආථර්ික වශයෙන් ස්වයංපෝෂිත කිරිමට උත්සහ ගනු ලැබුවා. එහිදි අබර්ුධයක් මතුවුවද පසුකාලිනව එය සමනයට පත් වුවා.1977 දි ජේරි පත් වු රජය විදෙස් සබඳතා පැවැත්විම වේගවත් කරනු ලැබුවා. මේ වන විට මෙරට ආථර්ිකය දැඩි ලෙස අස්ථාවර වෙමින් පවතිනවා.

ඒ සඳහා අප සියලු දෙනා වගකිව යුතුයි. වතර්මානයේ ජනතාව දේශපාලඥයින් පිළිකුල් කරන තත්ත්වයට පත්ව තිබෙනවා.

වතර්මානයේදී මෙරට වංචාව දූෂණය පිටුදැකිමේ කාලය ආරම්භ වී තිබෙනවා.මම පුද්ගලිකව ගරු සභාපතිතුමාගෙන් කිසිවක් ඉල්ලා නැහැ. මා විසින් ලුණුගල රෝහලට ලබා දුන් ජල පෙරන දෙක මේ වන විටත් සවි කර නොමැත. ඒ පිළිබඳව මා කණගාටුව ප්‍රකාශ කරමි. එසේම බහුකායර් ගොඩනැගිල්ලේ අඩුපාඩු

බොහෝමයක් පවතිනවා.සහා ලේකම්තුමිය මේ සම්බන්ධව අවධානය යොමු කළ යුතුයි. එහිදි විදුලිය සම්බන්ධතා ලබා දීම සම්බන්ධයෙන් ගැටළුවක් පවතිනවා. ඒ තුලින් කුලියට ලබා ගනු ලබන පිරිස අපහසුතාවයට පත් වනවා. එසේම පසුගිය දිනෙක පැවති මාගේ දරුවාගේ උත්සව අවස්ථාව සඳහා විදුලි ජනක යන්ත්‍රය ලබා දීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ මාගේ ස්තුතිය පිරිනමමි.

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා බොහෝ දෑ පිළිබඳව සභාවේ සාකච්ඡාවට ලක් කිරිම පිළිබඳව මාගේ ස්තුතිය එතුමාට හිමි විය යුතුයි. එතුමාගේ යෝජනාව අනුවයි අද දින සියලු දෙනාටම අදහස් දැක්වීමට අවස්ථාව ලද බවත් මතක තබා ගත යුතු කරුණකි.

**<u>ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා ඉතා හොඳ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවා. නමුත් එහි හරය මත කරුණු පදනම් වුවාද යන්න ගැටළුවකි. පසුගිය කාලයේදී රටේ ඩොලර් හිඟයක් උද්ගත වුවා.කොවිඩ් වසංගත තත්ත්වය බලපා තිබුනා. ණය වාරික ගෙවා ගැනිමට නොහැකි වුවා. ඒ තුලින් රජය දැඩි අසීරුතාවයට ලක් වුවා. අප සියලු දෙනා පවතින කෙටි කාලය තුල හෝ ප්‍රාදේශිය සභා පනතෙහි නෛතික රාමුව තුල කල හැකි කාර්යන් ඉටු කළ යුතුය. ඒ සඳහා සාධනීය යෝජනා ඉදිරිපත් කරමු. ගරු සභාපතිතුමාට පමණක් වැරැද්ද යොමු නොකර සියලු දෙනා එක්ව මෙම අභියෝගය ජය ගැනීමට ක්‍රියා කරමු.

**<u>ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා</u>**

ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් කාලීන යෝජනාවක් ඉදිරිපත් කිරිම සම්බන්ධව ස්තුතිය පිරිනමමි. වතුකරයේ ජනතාවගේ ඡන්දය ලබා ගනිමින් ප්‍රාදේශිය සභාවට තෝරාපත් වුවද මාගේ සීයාගේ ඥාතින් ඉන්දියානු ජාතිකයින් වෙයි. නමුත් අප ඉපදුනේ ලාංකිකයින් ලෙසයි. විදේශ ්ජාතින් හට අප රටට අතපෙවීමට ඉඩ නොතැබිය යුතුය. අප සුළු ජාතියක් වුවද අපේ මව් රටට ආදරෙයි. විවිධ ජාතින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වුවද සුළු ජාතියක් නොවන සිංහල බෞද්ධ නායකයෙකු තෝරා පත් කර ගනු ලැබුවා. නමුත් දැනට රටේ පවතින තත්ත්වය දරාගත නොහැකියි. අප සභාවෙ වියදම් පාශර්වය පිළිබඳව දිගින් දිගටම කතා කලද ආදායම් උත්පාදනය පිළිබඳව කතා කරන්නේ ටෙන්ඩර් හා කඩ කුලි සම්බන්ධව පමණි. එසේම සභාවේ ආරම්භ කරනු ලැබු කොම්පෝස්ට් අංගනයේ ඵලදායිතාවය වැඩි කිරිම පිළිබඳව මා කිහිප අවස්ථාවකදීම යෝජනා ඉදිරිපත් කලද ඒ පිළිබඳව සාධනීය පිළිතුරක් ලැබුනේ නැත.

මේ වන විට වතුකරයේ ජනතාව දැඩි අසිරුතාවයට පත්ව තිබෙනවා.දුෂ්කර කාලවලදී වුවත් වතු ජනතාව සිය කැපකිරිම් තුලින් ආර්ථික සංවධර්නයට උර දුන් ජන කොටසකි. නමුත් ඔවුන්ට සහනයක් ලැබි නොමැත. අප සභාවෙන් දැන් හෝ ජනතාවට හිතකර සේවාවක් සළසමු. පවතින සම්පත් වැඩි කර ගනිමු. වත්මන් පරපුර දේශපාලඥයින් පිළිකුල් කරනු ලබන තත්ත්වයට පත්ව තිබෙනවා. කෙසේ නමුත් මෙම අසීරු කාලයන් හමුවේ මඩොල්සිම නගරයේ ජනතාව වෙතද යම් සහනයක් සළසන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා.</u>**

කාලීන මාතෘකාවක් ගෙනහැර දැක්වීම පිළිබඳව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා වෙත මාගේ ස්තුතිය පිරිනමමි.මේ වන විට පක්ෂ පාට පසෙක ලා ජනතාව එක්රොක් වි තිබෙන අවස්ථාවකි. මිනිසුන් දැඩි පීඩනයකින් සිටින්නේ. ඒ අනුව පාලිමේන්තුව ප්‍රතික්ෂේප කිරිම සාධාරණය. මෙයට ප්‍රධාන හේතුව නිදහසින් පසු බිහිවු දේශපාලන පක්ෂ ක්‍රමයයි.රටේ නායකයින් තීරණයන් ගනු ලැබුවේ රට ගැනි සිතා නොව තම පක්ෂය ගැනි සිතාය. එමගින් රටේ ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වුවා.

ඉතිහාසය පුරාවටම ජනතාවාදි අයවැයක් ඉදිරිපත් වුයේ නැත. එම අයවැය හිඟය දිගින් දිගටම නිමර්ාණය වෙමින් පැවත තිබෙනවා. 2015 දි බලයට පත් වු රජය සමයේ සිදුවු මහ බැංකු මංකොල්ලය හා පාස්කු ප්‍රහාරය හේතුවෙන් කලකිරිමට පත් වු ජනතාව පොහොට්ටුව පක්ෂය ජයග්‍රහණය කරවීමට ක්‍රියාකරන ලදි. වත්මන් ජනාධිපතිතුමා කොවිඩ් තත්ත්වය සාථර්කව මැඩ පැවැත්වු නායකයෙකි. එසේම රටේ පවතින අසිරු තත්ත්වයට යම් පිළියමක් ලෙස ප්‍රාදේශිය සභාවන්ද යම් කැප කිරිමක් සිදු කළ යුතු බවයි මගේ හැඟිම.

එහිදි ගරු මන්ත්‍රිවරුන් ලෙස අප යම් කැපකිරිම් කරනා විට ගරු සභාපතිතුමා ද ඒ වෙනුවෙන් යම් දායකත්වයක් ලබා දිය යුතු බවයි මගේ හැඟිම. තවද රට වෙනුවෙන් අප හට සිදු කල හැකි කාය්‍ර්යන් ලේඛනගත කොට ලබන සභා වාරයට රැගෙන එන ලෙස ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා වෙතින් ඉල්ලීම් කර සිටිනවා.

**ගරු සභාව විනාඩි 05 කට අඩාලව කල් තබන බව ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දලුකොටුව මැතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදි. (ප.ව.1.05 ට)**

**ප.ව.1.10 ට නැවත ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දලුකොටුව මැතිතුමා විසින් ආරම්භ කරන ලදී**

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා.**

**05/2/2.** අධික ජීවන බර නිසා ජීවත් වීමට බැරි අපේ ප්‍රදේශය සහ බල ප්‍රදේශයේ ජනතාවට ලබාදිය හැකි සහන පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

අද දින බොහෝ පිරිසක් මාගේ යෝජනාව අවබෝධ කර ගැනිමෙන් අනතුරුව ඒ සම්බන්ධව අදහස් දැක්වීම පිළිබඳව මාගේ සතුට ප්‍රකාශ කරමි. එසේම මා හට ඡන්දය ලබා දුන් ජනතාව වෙත ප්‍රාදේශිය වශයෙන් මෙන්ම ජාත්‍යාන්තර වශයෙන්ද සේවාවන් ඉටු කොට තිබෙන බවට ආත්ම තෘප්තියක් මා සතුව ඇත. සභාව පත් වූ ආරම්භක අවස්ථාවේදිම මා විසින් යෝජනා කරනු ලැබූවා කොස් පැළ 5000 ක් සිටුවීම උචිත බව. නමුත් ඒ පිළිබඳව සාධනීය ක්‍රියාමාගර්යක් ගනු ලැබුවේ නැත. එය ඉටු වුවා නම් වත්මන් ආහාර අබර්ුධයට යම් විසඳුමක් ලබා ගත හැකිව තිබුනි.

තවද පිස්ස ප්‍රදේශයේ පිහිටි ජල විදුලි බලාගාරය වැඩිදියුණු කිරිම සම්බන්ධ යෝජනාව ද සභා ගත කළ නමුත් ඒ සම්බන්ධව කිසිදු පියවරක් ගනු ලැබුවේ නැත.මේ පිළිබඳව විදුලි බල අමාත්‍යාංශ ලේකම්තුමිය දැනුවත් කිරිමෙන් අනතුරුව එතුමිය කඩිනමින් ක්‍රියාත්මක වූ අතර ඒ පිළිබඳව එතුමියට මාගේ ස්තුතිය පිරිනමමි. තවද උඩකිරුව හා ගල්වෙලගම පිහිටි කුඩා ජල විදුලි බලාගාර ද නිරික්ෂණය සිදු කරන බව මා වෙත දැනුම් දී ඇත.

එසේම කිතුල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවධර්නය කිරිමට එවකට එම විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කලද කිසිදු පියවරක් නොගත් අතර වත්මන් විෂය භාර අමාත්‍යතුමා ඒ පිළිබඳව සාධනීය පිළිතුරක් ලබා දී තිබෙනවා.

එසේම ග්‍රාමිය පාලම් ඉදි කිරිමට අදාළ දුම්රිය දෙපාතර්මේන්තුව සතු කෝච්චි පෙට්ටි වැසි හා දුම්රිය පීලි යොදා ගත හැකි අතර මේ පිළිබඳව ගරු ප්‍රවාහන අමාත්‍යතුමා දැනුවත් කිරිමට අපේක්ෂා කරමි. එසේම මිට පෙර මා විසින් යෝජනා කරනු ලැබූ සහන වෙළඳ සැලක් ස්ථාපිත කිරිම හා සහන මාළු වෙළඳසැලක් ස්ථාපිත කිරිමේ යෝජනාවද ක්‍රියාත්මක කරන මෙන් නැවතත් ඉල්ලා සිටින අතර සභා ලේකම් තුමිය විසින් මෙම යෝජනා ප්‍රමුඛ කොට සළකා කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

**ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

වත්මන් ආථර්ික අබර්ුධයක් පවතින බව ඔබ මෙන්ම මා ද දන්නා කරුණකි. ඒ සම්බන්ධව තීරණයන් ගනු ලැබුවේ පාලර්ිමේන්තුවෙනි. එසේම ඒ සඳහා විසඳුම් ගත යුත්තේ ද පාලර්ිමේන්තුවෙනි.එසේම ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා කාලෝචිතය. එසේම සේවා කාලය තුල යම් යම් යෝජනා ක්‍රියාත්මක කිරිමට නොහැකි විම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි. නමුත් ඒපිළිබඳව සැළකිසිමත් වෙමි. මේ තාක් ගමනක් ඒමට මා හට ඔබ සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලදි. මගේ පාශර්වයෙන් යම් අඩුපාඩුවක් සිදු වි ඇත්නම් එය නිවැරදි කර ගන්නම්. සභා ලේකම්තුමියගෙන් මා ඉල්ලා සිටින්නේ විගණනයක් සිදු කරන්නේ නම් කාලෝචිත බවයි.

මා එක් රුපියලක් හෝ වංචා කොට නොමැති බව මාගේ හෘද සාක්ෂියට එකඟව මා දනිමි.නනතුරු ලබා ගැනිම පහසු වුවද ඒවා පවත්වා ගැනිම අසීරු බව මා හොඳින් දන්නා කරුණකි. එසේම මෙවැනි ආයතනයක අත්තනෝමතිකව කටයුතු කළනොහැකියි. ගරු මන්ත්‍රී අනුර වික්‍රමතුංග මැතිතුමා ප්‍රකාශ කළ පරිදි කාපට් මාගර් අප ප්‍රදේශයට ලැබුනේ 03 කි. එසේම රුපියල් ලක්ෂයක් දක්වා මුදල් වැය කිරිමේ බලය ලබා දුන්නේ මාහට නොවන බවත් එය ලැබුනේ මුදල් කමිටුවට බවත් ප්‍රකාශ කරමි.

එසේම කොම්පෝස්ට් ව්‍යාපෘතිය ද සාථර්කව පවත්වාගෙන යන අතර එය අධික්ෂණය සඳහා ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමාගේ මුලිකත්වයෙන් කමිටුවත් පත් කිරිමට අදහස් කරමි.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

විපක්ෂයේ කායර්ය මැනවින් ඉටු කරනු ලබන ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා වෙත මාගේ ස්තුතිය පුද කර සිටින අතර කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශයෙන් බැහැරව සේවකයින් බඳවා ගැනිමේ අනිසි විපාක දැන් විඳිමට සිදුව ඇති බව දක්නට ලැබේ.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා.**

**05/2/3.** ලුණුගල ප්‍රාදේශිය සභාවට එවකට හිටපු මුදල් කමිටුවට මහා සභාවෙන් 2019 පෙබරවාරි මස ලබාදුන් රුපියල් ලක්ෂයට යටත්ව වියදම් කිරිමේ බලය 2019 ජුලි මසින් මාස 06 සම්පූණර් වන අතර, එම කාලයෙන් පසුව එම ලක්ෂය දක්වා වියදම් කිරීමේ බලය බල රහිත වන අතර, එම බලය 2022.04.26 වන දින සිට රු.25000.00 දක්වා නැවත වැඩි කිරිමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

ප්‍රාදේශිය සභා පනත ප්‍රකාරව සභා අනුමැතියකින් තොරව වැය කිරිමට අදාළ මුදල් ප්‍රමාණය තීරණය කිරිම වාෂර්ිකව අලුත් කළ යුතු අතර එය ඉදිරියට රු.25000.00දක්වා අඩු කිරිම කළ යුතු අතර ඊට වඩා වැඩි මුදලක් වැය කිරිමට අවශ්‍ය වන්නේ නම් සභා අනුමැතිය ලබා ගත යුතු බව සුදුසුය

**ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

පවතින ජල හිඟ ගාස්තු අය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු අතර ඒ සඳහා ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව කටයුතු කළ යුතු අතර හිඟ මුදල මුළුමනින්ම කපා නොහැර සභාවට කොටසක් අය කර ගැනීමට කටයුතු කළ යුතු බවයි මගේ හැඟීම.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා**

මෙලෙස ජල පාරිභෝගිකයින් හට විශාල හිඟ ගාස්තුවක් පැවරීම අසාධාරණයකි. එහිදී ඔවුන් ජල සම්බන්ධතා විසන්ධි කරනු ඇතැයි බියෙන් විශාල මාසික බිල්පත් පියවා තිබෙනවා. එසේ කිරීම ජනතාව වෙත බලෙන් බරක් පැටවීම හා සමානය. මාගේ යෝජනාව වන්නේ එම විශාල මාසික බිල්කිරීම් ගාස්තුව කපා හැරිය යුතු බවයි. ඒ තුලින් ජනතාවට යම් සාධාරණයක් ඉටු කළ හැකි වනු ඇත. ගිණුමේ හිඟ ශේෂය කපා හැරිය හැකිය.

**05/2. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා.**

**05/2/4.** අධික ජීවන බරට සහනයක් වශයෙන් ලුණුගල ප්‍රාදේශිය සභාවට අයත් ජල බිල් ගෙවන පාරිභෝගිකයට සහනයක් වශයෙන් නිසියාකාරව ජල බිල් ගෙවන පාරිභෝගිකයන් හට ආර්ථික වශයෙන් සහනයක් ලෙස මිරිස්/බටු/මාලු මිරිස් පැල 5 බැගින් නිවසටම ජල බිලත් සමඟ ලබාදීමට සහ එම පැල සිටුවීමට අවශ්‍යය උපදෙස්/සහයෝගය දීමට යෝජනා කරමි. උපරිම වියදම රු.25000.00 (පැලයක් රු. 3 යි. පැල 6000 ක් අවශ්‍යයි)

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

**06. කාරක සභා වල වාතර්ා ඉදිරිපත් කිරීම.**

**06/1. මුදල් කමිටු වාතර්ාව**

2022.04.07 දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ කමිටු ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**06/1/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

මුදල් කමිටු වාතර්ාවේ අංක 06 කරුණට අදාළව රු.74000.00 ක් වැය කොට ඇත්තේ කුමක් සඳහාද?

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

බැකෝ ලෝඩර් යන්ත්‍රය සඳහාය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

එය රථය සඳහා බැටරි යොදන 03 වෙනි අවස්ථාව. මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

ඒ4 බන්ඩල් ලබා ගැනීමේදි වැය කළ මුදල මුද්‍රණ දෝෂය සකස් කල යුතුය.

**2022.04.07 වන දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

**06/2. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාතර්ාව - නැත**

**06/3.නිවාස හා ප්‍රජා සංවධර්න කමිටුව - නැත**

**06/4. කාමරීක සේවා කමිටුව - නැත**

**07. ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ /එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.**

**7/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

මේ මස ආදායම් හා වියදම නොගැලපීමක් දක්නට ලැබෙනවා. ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන බව යෝජනා කරන ලදී.**

**එම යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාව විසින් ස්ථිර කරන ලදි.**

**විෂයභාර නිළධාරි විසින් ඒ සම්බන්ධව සභාව වෙත කරුණු පැහැදිලි කරන ලදි.**

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් කාරක සභාව මහා සභාවක් බවට පත් කරන බව යෝජනා කරන ලදී.**

**එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

**2022 මාතර්‍ මස ලැබීම්, ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ හා එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්‍ාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්‍ාවක් බව සහා සම්මත විය යුතු යැය ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව එම වාතර්‍ාව සභා සම්මත විය.**

**08. වෙනත් කරුණු**

**<u>08/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

1. මහජන අවශ්‍යතා සඳහා රාජ්‍ය අංශයෙන් සිදුවන බාධා අත්‍යාවශ්‍ය සේවා සඳහා ප්‍රමුඛතාවය, ජීවන බර නිපර්‍ාක්ෂික අරගලය තරුණ නැගිටීම

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා.</u>**

කිහිප අවස්ථාවකදීම බැකෝ ලෝඩර් යන්ත්‍රයේ ටයර් මාරු කොට තිබෙනවා. බොහෝ විට එය කායර්‍ාලයේ නවතා තිබෙන බව මා දැක තිබෙනවා.මෙලෙස ටයර් යෙදීම සිදු කලද ලාභ ලැබීමක් සිදු වනවාද යන්න ගැටළුකි. මේ වන විට ගරු මන්ත්‍රීවරුවන් වෙතද ලබා දිම සිදු නොකරන අතර ලක්ෂ 04 ක් යනු ආයතනයට විශාල මුදලක් වන බැවින් මේ පිළිබදව සභා ලේකම්තුමියගේ විශේෂ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

නිළධාරින් වෙත පමණක් වගකීම නොපවරා ගරු මන්ත්‍රීවරුන්ද මේ පිළිබදව නිරික්ෂණය කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

2020 වසරේදි ආබාධිත පුද්ගලයෙකු හට දිමනාවක් ලබා දීමට මැදිහත් වීම සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් කායර්‍ාලයේ නිළධාරියෙකු විසින් රාජකාරියට නොගැලපෙන අයුරින් කටයුතු කළ අතර ඔවුන් අවසානයේදි මා හට විරුද්ධව විරෝධතාවයක් පවා සිදු කරන ලදි. මේ සම්බන්ධව පරික්ෂණයක් ඉල්ලා සිටි අතර මේ වනතුරු කිසිදු පරික්ෂණයක් සිදු වුයේ නැත.

පසුගිය දිනෙක ඉන්ධන පිරවුම්හල අසල යම් ගැටුම්කාරි තත්ත්වයක් උද්ගතවිය. එයට හේතුව ලුණුගල ප්‍රධාන පොලිස් පරික්ෂක සි.අයි.බාලසූරිය මහතාගේ නොසන්සුන් හැසිරිමය. එහිදි ඉන්ධන ලිටර් 2000 ක් වාහන සඳහා ලබා දී, ඉතිරි ඉන්ධන බුලි වලට ලබා දී ලිටර් 600 ක් පොලිස් ස්ථානයට රැගෙන ගොස් තිබෙනවා. එහිදි එතුමා අයි.ඕ.සි.ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන නිකුත් නොකරන බවට එම ස්ථානයේ මාධ්‍ය ප්‍රකාශක ලෙස ජනතාව කුපිත කිරිමේ අදහසින් ප්‍රකාශ කොට තිබෙනවා.එය බරපතල වැරැද්දක්.පාරිභෝගික අයිතිය කඩ කිරිමකි. ඉන්ධන ලිටර් 200 ක් ප්‍රාදේශිය සභාවට ලබා දුන් බව ඉහල නිළධාරින්ට වාතර්‍ා කොට තිබෙන නමුත් එලෙස අප ආයතනයට ඉන්ධන ලබා දීමක් සිදු කර නොමැත. පොලිස් ස්ථානයේ ඉන්ධන ගබඩා කළ නොහැකියි. එම ආරවුල විසදීමට මා මැදිහත් වු විට එතුමා ප්‍රකාශ කරනු ලැබුවේ මා සමඟ පුද්ගලික ආරවුලක් පවතින බවත්ය.මාගේ ජිවිත ආරක්ෂාව වෙනුවෙන් මේ සියලු කරුණු සභාගත කරමි. එසේම මානව හිමිකම් කොමිෂන් සභාවට ද පැමිණිල්ලක් සිදු කරමි.

තවද මෙම ආණ්ඩුව මඟින් 20 වැනි සංශෝධනය සිදු කිරිම මත පොලිස් කොමිසම අහෝසි කිරිම තුලින් මෙවැනි නිලධාරින්ගේ නොමනා ක්‍රියාවන් වධර්‍නය වි තිබේ.එම සංශෝධනය පාලර්‍ිමේන්තුව තුලින්ම නිවැරදි කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා.</u>**

රඹුක්කන සිදුවිමෙන් මියගිය නිරායුධ එක්දරු පියා වෙනුවෙන් මාගේ ශෝකය ප්‍රකාශ කර සිටිමි. එසේම එවැනි සිදුවිමක් ලුණුගල ප්‍රදේශයේ ඇති විමට පසු ගිය දිනෙක කරුණු යෙදිනි. එම නොමනා හැසිරිම සිදු කල පොලිස් නිළධාරිතුමා පිළිබදව ඌව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි. එහි පිටපතක් මා වෙත යොමු කරන ලෙස ඉල්ලමි. එම සිදුවිමෙන් මාගර්‍ය අවහිර වුවා. බස් රථවල ගමන් ගත් ජනතාව දැඩි පිඩාවට පත් වුවා. එබැවින් එම නිළධාරියාගේ ක්‍රියා කලාපය දැඩි

ලෙස පිළිකුලෙන් යුතුව හෙලා දකින අතර මහජනතාව පීඩාවට පත් කරමින් කටයුතු කරනු ලබන මෙවැනි නිළධාරින් හට නිත්‍යානුකූලව කටයුතු කළ යුතු බවයි මගේ හැඟිම.

**ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා**

අසනීප තත්ත්වයන් හේතුවෙන් අද දින සභා වාරය සඳහා සහභාගී නොවන බවට දුරකතනයෙන් දැනුම් දුන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කර දෙන ලෙස යෝජනා කරන ලදි.

- ගරු උප සභාපති ඩී.සෙල්වරාණි මැතිනිය
- ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා
- ගරු මන්ත්‍රී ආර්.ගනේෂ මූතරී මැතිතුමා
- ගරු මන්ත්‍රී ආර්.කණගසුන්දරි මැතිනිය
- ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා

එම යෝජනාව ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**න්‍යාය පත්‍රය අනුව අද දින සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.**

**මීලග මහ සභා රැස්වීම 2022.05.24 වන දින පෙ.ව.10.00 ට පවත්වන බව දැනුම් දුනි.**

(සී.ජගත්චන්ද්‍ර දලුකොටුව),
සභාපති,
ප්‍රාදේශීය සභාව,
ලුණුගල